# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.01.16 පැය 1055 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 72 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


**හෙරොයින් හා කේරළ ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ අපරාධ විමශර්න අංශය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රීලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.01.16 වන අද දින අළුයම කොහුවල පොලිස් වසමේ කළුබෝවිල ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර ඇත.

එහිදි, **හොරොයින් කිලෝ 01 ග්‍රෑම් 594 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු, ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකාරියක් හා කේරළ ගංජා කිලෝ 04 ක් සන්තකයේ** තබාගෙන සිටි සැකකරුවෙකු ජංගම දුරකථනයක් ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

හෙරොයින් සමඟ අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් හා සැකකාරිය වයස අවුරුදු 54 ක් වන කළුබෝවිල ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර කේරළ ගංජා සමඟ අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

සැකකරුවන් හා සැකකාරිය 2025.01.16 වන අද දින ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න අංශය වැඩිදුර විමශර්න පවත්වාගෙන යනු ලබයි.

අත්අඩංගුවට ගත් දේපළ වල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**